

විදුදය
භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය
සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA
Journal of Language, Literary, Cultural and Media Studies
Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

2020, 01 (01): 08-17

ISSN: 2235-9001 Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya

# ඖරන්ගාබාද්හි වඝෝරා මිටියාවතේ ඓතිහාසික බෞද්ධ කලා උරුමය

සුනිල් දැරංගල

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
sunild@sjp.ac.lk

**සංක්ෂේපය**

මානව සමාජයේ පවතින විවිධ කලා සම්ප්‍රදායයන් අතුරින් සිතුවම්වලට හිමි වන්නේ අතිශය වැදගත් ස්ථානයකි. වසර දහස් ගණනක් පැරණි සිතුවම් ලෝකයේ විවිධ ස්ථානවල පවතී. ප්‍රංශයේ ලැස්කෝ හා ස්පාඤ්ඤයේ ඇල්ටමීරා ගුහාවල ඇති චිත්‍ර, ඉන්දියාවේ අජන්තා ගුහා ආශ්‍රිතව ඇඳ ඇති චිත්‍ර මෙන්ම ශ්‍රී ලංකාවේ සීගිරි චිත්‍ර ද එබඳු සිතුවම් අතර ප්‍රධාන තැනක් ගනී. ලැස්කෝ, ඇල්ටමීරා ගුහා සිතුවම් ප්‍රාග් ඓතිහාසික මානව නිර්මාණ ලෙස සැලකේ. ෆ්‍රෙස්කෝ සිතුවම් ලෙස හඳුනා ගෙන ඇති අජන්තා හා සීගිරි සිතුවම්, ඒවා අඳිනු ලැබූ කාලය, භාවිත කොට ඇති වර්ණ, හැඩතල ආදි විවිධ ලක්ෂණ පදනම් කොට ගෙන කිසියම් සාම්‍යයක් පෙන්නුම් කෙරෙන බව හඳුනා ගෙන ඇත. මේ අතුරින් අජන්තා සිතුවම් ඍජුව ම බෞද්ධාගමික පසුබිමක් තේමා කර ගනිමින් නිර්මාණය වූ ඒවා ය. එහෙත් සීගිරියේ ලලනා සිතුවම් මගින් ඍජු බෞද්ධාගමික පදනමක් හඳුනා ගත නො හැකි ය. මේ අනුව මෙම චිත්‍ර සම්ප්‍රදායය දෙකට අදාළ සමානකම් මෙන් ම අසමානකම් ද පවතින බව නිරීක්ෂණය කළ හැකි ය.

**මුඛ්‍ය පද:** ෆ්‍රෙස්කෝ සිතුවම්, අජන්තා ගුහා චිත්‍ර, සීගිරි චිත්‍ර

## 1. හැඳින්වීම

ඉන්දියාවේ මහා රාෂ්ට්‍ර ප්‍රාන්තයේ ඖරන්ගාබාද් (*Aurangabad*) දිස්ත්‍රික්කයේ පිහිටි අජන්තා බෞද්ධ ලෙන් විහාර සංකීර්ණය ලොව පුරා ප්‍රචලිතව ඇත්තේ එහි ඇති ඉපැරණි රමණීය බිතු සිතුවම් හේතුවෙනි. එමෙන්ම ඉතා විසිතුරු ලෙස නිර්මාණය කරන ලද ගල් ගුහා 29ක ඇති ශෛලමය මූර්ති හා කැටයම් මගින් ද ඉන්දීය කලා උරුමයේ අභිමානය ලෝකයට කියාපායි. එහි ඇති බිතු සිතුවම් ශ්‍රී ලාංකිකයන්ට බෙහෙවින් සමීප වී ඇත්තේ ශ්‍රී ලංකාවේ සීගිරියේ ඇති බිතු සිතුවම් අජන්තා සිතුවම්හි ආභාසය ලබා නිර්මාණය කොට ඇති බවට ශාස්ත්‍රඥවේදීන් වැඩි දෙනෙකු අදහස් පළ කොට තිබීම නිසා ය. මේ අතර ඇතැමෙකු පවසන්නේ සීගිරි හා අජන්තා චිත්‍ර අතර සමානත්වයක් දැකිය නො හැකි බවයි. කුමන මතවාද පැවතියද අජන්තා සිතුවම් යනු ඉන්දියානු ඉතිහාසය, සංස්කෘතිය හා කලාවේ ඒකදේශයක් විදහාපාන, ලොව මවිතයට පත් කළ ඓතිහාසික උරුමයක් බව අවිවාදිත ය. විශේෂයෙන්ම ඉන්දියාවේ මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ බුදු දහම විරාජමානව පැවති සාතවාහන හා වාකාටක රාජ්‍ය යුගවල අභිමානවත් ඉතිහාසය ද මෙම චිත්‍ර මගින් හඳුනා ගත හැකි ය. මෙම

කෙටි ලිපියෙහි අරමුණ වන්නේ අජන්තා විහාර සංකීර්ණය පිළිබඳවත් එහි සිතුවම්වල ස්වභාවය හා තේමා පිළිබඳවත් මූලික හඳුනා ගැනීමක් සිදු කිරීමයි.

මෙම ලිපිය සම්පාදනයේදී අජන්තා ලෙන් විහාර සංකීර්ණය නැරඹීමෙන් ලබා ගත් අවබෝධයත්, ඒ පිළිබඳව ලිඛිත මූලාශ්‍රය හා අන්තර්ජාලය ඇසුරෙන් ලබා ගත් තොරතුරුත් බෙහෙවින් උපකාරී විය.

## 2. සාකච්ඡාව

අජන්තා ලෙන් විහාර සංකීර්ණය පිහිටා ඇත්තේ ඉන්දියාවේ මහා රාෂ්ට්‍ර ප්‍රාන්තයේ මුම්බායි නගරයේ සිට කිලෝ මීටර 300ක් පමණ දුරිනි. ඖරන්ගාබාද් නගරයේ සිට අජන්තාවට ඇති දුර කිලෝ මීටර 104ක් පමණ වේ. අජන්තාවට සමාන ශෛලමය ලෙන් විහාර සංකීර්ණයක් එහි සිට කිලෝ මීටර 100ක් පමණ දුරින් වූ ඇල්ලෝරාවේ ද පිහිටා ඇත. ඇල්ලෝරාව වඩාත් ප්‍රචලිතව ඇත්තේ එහි ඇති විශිෂ්ට ප්‍රතිමා සහ විස්මයජනක ගෘහ නිර්මාණ ශිල්පය නිසා ය. එහෙත් අජන්තාව වඩාත් අවධානයට යොමුව ඇත්තේ එහි ඇති අතිරමණීය බිතු සිතුවම් හේතුවෙනි. අනෙක් අතට ඇල්ලෝරාවේ බෞද්ධ හින්දු හා ජෛන යන ආගම් තුනට ම අයත් ලෙන් සංකීර්ණ හා ප්‍රතිමා දැකිය හැකි අතර අජන්තාව වූ කලී මුළුමනින් ම බෞද්ධ විහාර සංකීර්ණයකි.

අජන්තාවේ කවාකාරව පිහිටා ඇති ශායද්රි *(Sahyadari*) කඳු පන්තියේ ස්වාභාවික පර්වත සමූහයක් හාරා සකසන ලද ලෙන් 29ක ලොවම මවිතයට පත් කළ සිතුවම් අදට ද සුරක්ෂිතව පවතී. වගෝරා ගංගාව *(Wagora*) කවාකාර කඳු පන්තිය හා පහළ මිටියාවත සශ්‍රීකවත් කරමින් සොබා දහමේ විසිතුරු සිතුවමක් සේ ගලා බසී. අතීතයේ මහා රාෂ්ට්‍රයේ ප්‍රධාන බෞද්ධ කේන්ද්‍රස්ථානයක්ව පැවති බවට සැලකිය හැකි සාධක අතිවිශාල ප්‍රමාණයක් මෙම ස්ථානයෙන් හමු වේ. භාවනානුයෝගී බෞද්ධ භික්ෂූන්ට තම ආධ්‍යාත්මික අරමුණු වෙනුවෙන් කැප වීමට මෙතරම් සොඳුරු නිසල පරිසරයක් ලොව වෙනත් තැනක ඇති දැයි සිතෙන තරමට ම එම පරිසරය රමණීය බව කිව යුතු ය.

මෙම ලෙන් විහාර සංකීර්ණය ඉදි වී ඇත්තේ ක්‍රි.පූ. 200 සිට ක්‍රි.ව 650 දක්වා දීර්ඝ කාලයක් මුළුල්ලේ ය. වසර 850ක් පමණ දිගු කාලයක එහි වැඩ සිටි භික්ෂූන් වහන්සේලා ප්‍රමුඛ කලා ශිල්පීන් මෙම නිර්මාණ සඳහා දායක වන්නට ඇති බව විශ්වාසයයි *(Almohammadi, 2011: p.8*). මෙම විහාර සංකීර්ණයේ ඉදි කිරීම් සඳහා මහා රාෂ්ට්‍රයේ ප්‍රධාන රාජ වංශ 2ක අනුග්‍රහය ලැබී ඇත.

- සාතවාහන (*Satawahana)*
- වාකාටක *(Wakataka)*

ඉහත රාජ වංශ දෙකට අමතරව ධනවත් ප්‍රභූන් සහ වෙළෙන්දන්ගේ ආධාර උපකාර මත අජන්තා ලෙන් විහාර සංකීර්ණයේ ඉදිකිරීම් සිදු වී ඇති බවට තොරතුරු හමු වී තිබේ.

ක්‍රි.පූ. 2 වන සියවසේ සිට වසර 900ක පමණ කාලයක් අජන්තාව විරාජමානව පැවතිණි. අනතුරුව හින්දු හා ජෛන බලය ඉස්මතු වීමත් සමඟ මෙම අතිවිශිෂ්ට ලෝක බෞද්ධ උරුමය, වසර සිය ගණනක් වනාන්තරයෙන් වැසී ගොස් තිබුණි. එය නැවත ලෝකයට හඳුනා ගැනීමට අවස්ථාව සැලසෙන්නේ ඉන්දියාවේ බ්‍රිතාන්‍ය පාලන සමයේදී ය. 1819දී කොටි දඩයමේ ගිය බ්‍රිතාන්‍ය හමුදා කණ්ඩායමක සිටි ජෝන් ස්මිත් *(Johon Smith*) නම් නිලධාරියාගේ නෙත ගැටුණු අජන්තා ලෙන් සිතුවම් නැවත ලෝකයට ඉස්මතු විය.

අජන්තාවෙහි ඉදි වී ඇති විහාර ලෙන්වලින් 5ක් චෛත්‍ය ගුහා වන අතර ඉතිරි ඒවා ආරාම ලෙන් ලෙස ඉදි වී තිබේ. එම ආරාම ලෙන්වලින් 8,9,10,12,13,30 යන ඒවා හීනයාන සම්ප්‍රදායයට අයත් සේ සැලකේ. හීනයාන

සම්ප්‍රදාය අනුව අතීත කලාකරුවා බුදුන්ගේ ප්‍රතිමා නිරූපණ කිරීමට මැලි වූ බව පෙනේ. බුදුන් වෙනුවට බොහෝ විට ස්තූපය, බෝධිය, ශ්‍රී පාදය, ධර්ම චක්‍රය භාවිත කෙරිණි. පසුකාලීනව මහායාන සම්ප්‍රදායකයන් බුදු පිළිමය නිර්මාණය කොට වන්දනාමාන කිරීම සඳහා යොමු වී ඇත.

අජන්තා සිතුවම් අඳිනු ලැබූ ස්ථාන ප්‍රධාන වශයෙන් දෙවර්ගයකි.

- බිත්ති මත ඇඳි චිත්‍ර
- සිවිලිම්වල ඇඳි චිත්‍ර

මෙම චිත්‍ර ඇඳීම සඳහා කලාකරුවා මුලින්ම සිදු කොට ඇත්තේ කටුව හා මිටිය ආධාරයෙන් ගල් ගුහාවල රළු පෘෂ්ඨය සමතලා කොට මැටි ස්ථරයක් ආලේප කිරීමයි. ඉන් පසු ගොම *(cow dung)* සහ දහයියා *(rice husk)* මිශ්‍ර කොට තවරන ලද ස්ථරයක සුදු හුනු භාවිතයෙන් සිනිඳු ඔප දැමූ මතුපිට සිතුවම් ඇඳීමට භාවිත කොට ඇත. මෙම සරල තාක්ෂණය මගින් වර්ණ අවශෝෂණ කර ගැනුණු අතර වර්ණවල ගුණාත්මකභාවය දිගු කලක් රඳවා ගැනීමට එය ඉවහල් වී ඇත. මෙසේ තෙත පසුබිමක චිත්‍ර ඇඳීම ප්‍රෙස්කෝ තාක්ෂණයේ එක් ලක්ෂණයකි. පැරණි චිත්‍ර සම්ප්‍රදායේ ප්‍රධාන ක්‍රමවේද තුනක් හඳුනා ගත හැකිය.

- ප්‍රෙස්කෝ සිකෝ
- ප්‍රෙස්කෝ බුවනෝ
- ටෙම්පරා

ප්‍රෙස්කෝ සිකෝ යනු වියළි බදාමය මත චිත්‍ර ඇඳීමයි. තෙත බදාමය මත චිත්‍ර ඇඳීම ප්‍රෙස්කෝ බුවනෝ ලෙස හඳුන්වයි. මැලියම් හෝ බන්ධන මාධ්‍යයෙන් චිත්‍ර ඇඳීම ටෙම්පරා නම් වේ.

අජන්තා සිතුවම් ප්‍රෙස්කෝ චිත්‍ර *(Presco painting)* ලෙස පොදුවේ හඳුන්වනු ලැබුවද, එහි ඇත්තේ මැලියම්වලට වර්ණ මිශ්‍ර කිරීමෙන් (බන්ධන මාධ්‍යයක් එක් කිරීමෙන්) තෙත බදාමය මත අඳිනු ලැබූ චිත්‍රයි. මෙම සිතුවම් සඳහා භාවිත කොට ඇති වර්ණ අතුරින් කහ, රතු, නිල්, කළු, කොළ වැනි වර්ණ කැපී පෙනේ. එම වර්ණවලට අමතරව එකී වර්ණ මිශ්‍ර කොට සකසා ගත් වෙනත් වර්ණ ද පවතී. ඇතැම් තැනක දම් පාට, ලා කොළ පාට ද, වැඩි වශයෙන් දුඹුරු වර්ණය ද දැකිය හැකි ය. ලාම්පු දැලිවලින් කළු වර්ණය සකසා ගෙන ඇත. වර්ණ වැඩි ප්‍රමාණයක් සකසා ගෙන ඇත්තේ ඛනිජ වර්ගවලිනි. රතු හා කහ ලබා ගෙන ඇත්තේ හිරියල් *(ochre)* වලිනි. කොළ පැහැය ලබා ගෙන ඇත්තේ ගිනි කඳු පාෂාණවලිනි. සුදු වර්ණ සඳහා පිඟන් මැටි (*Kaolin)* සහ ජිප්සම් *(Gypsum)* නම් මැටි වර්ගයක් භාවිත කොට ඇත. නිල් වර්ණය සඳහා භාවිත කොට ඇත්තේ ලැපිස් ලසූලි *(Lapis Lazuli* - දීප්තිමත් නිල් මැණික් වර්ගයක්) නම් ඛනිජ ද්‍රව්‍යයකි.

### 2.1 අජන්තා සිතුවම් තේමා

අජන්තා සිතුවම්වල තේමා මුළුමනින්ම බෞද්ධාගමික පසුබිමක් ගෙන ඇති බව පෙනේ. බුදුරදුන්ගේ ජීවිතයේ විවිධ අවස්ථා, ජාතක කතාවල සංසිද්ධි, දේව රූප, බෝධිසත්ත්ව රූප ආදිය ඒ අතර වෙයි. තේමා ආගමික මුහුණුවරක් ගත්ත ද සිත්තරා ලෞකිකත්වය ඉතා ප්‍රේමනීය ලෙස නිර්මාණය කොට ඇති බව දැක ගත හැකි ය. මෙම ස්ථානය වරක් නිරීක්ෂණය කළ ජවහර්ලාල් නේරු (ඉන්දීය අගමැතිතුමා) සඳහන් කොට ඇත්තේ, *"මෙහි සුරූපී කුමාරිකාවන් ඇතුළු සුන්දර කාන්තාවන් ඕනෑ තරම් සිටී. ඔවුන් ඉතා ප්‍රචලිත ය. අජන්තාහි වාසය කළ සන්සුන් මනසින් යුත් භික්ෂූන් ලෞකික ජීවිතයේ සෞන්දර්ය ඉතා ආදරයෙන් පින්තාරු කොට ඇත"* යනුවෙනි.

අජන්තා සිතුවම්වලට බෞද්ධ ජාතක කතා හෝ බුදුන් සම්බන්ධ සංසිද්ධි තේමා වුව ද ඒවා ලෞකික ජීවිතයේ අභිප්‍රායවලට අනුගතව ඉස්මතු කොට ඇති බවක් පෙනේ. දරු දැරියන් ඇකයට ගත් මව්පියන් මෙන්ම ස්ත්‍රී

ලාලිත්‍ය ඉස්මතු කෙරෙන චිත්‍ර ද, ශෛලමය මූර්ති ද විශාල ප්‍රමාණයක් අජන්තා ලෙන් තුළින් දැක ගත හැකි ය.



(පවුල් ජීවිතය නිරූපණය කරන ශිලා මූර්තියක්)

අජන්තා ගුහා සිවිලිම්වල ඇති සිතුවම් මගින් වැඩි වශයෙන් පෙන්නුම් කෙරෙන්නේ මල්, පැළ, කුරුල්ලන්, සතුන්, මිථ්‍යා සතුන් සහ අර්ධ දිව්‍ය සතුන් ය. මෙකී චිත්‍රවලින් පැහැදිලි වන්නේ සොබා දහමේ බලය හා සුන්දරත්වය ඉස්මතු කිරීමට අජන්තා සිත්තරුන් දැරූ උත්සාහයයි.

ඉන්දීය සංස්කෘතියේ සෑම ස්ථරයක්ම පාහේ මෙම චිත්‍රවලින් විද්‍යමාන වේ. රජවරුන්, රජ කුමාරවරුන්, කුමාරිකාවන්, බෝධිසත්ත්වයන්, ශාන්තුවරුන් මෙන්ම දැසි දස්සන්, සිඟන්නන් ද, වහල්ලුන් ද පව්කාරයන් ද නිරූපණය වී ඇති මෙම චිත්‍ර මගින් ඉන්දීය සංස්කෘතියේ ඉතිහාසය නරඹන්නන්ගේ දෑස් ඉදිරිපිට ජීවමාන කරනු ලබයි.

අජන්තා ගුහා සිතුවම් අතුරින් අංක 1 ගුහාවෙහි ඇති ජාතක කතා චිත්‍රවලට අමතරව පද්මපානි බෝසතුන්ගේ චිත්‍රය මුළු ලෝකයේ ම අවධානයට ලක් වූවකි. බෝසත්වරයකුගේ කරුණාව, මෛත්‍රිය, ප්‍රඥාව වැනි අභ්‍යන්තර ගුණාංග මෙන් ම බලය, තේජස, සුන්දරත්වය වැනි බාහිර ගුණාංගයන් ද එම සිතුවමින් ඉස්මතු කොට පෙන්වයි. එහි වර්ණ සංයෝජනය මගින් නරඹන්නන්ගේ අවධානය එක්වර ආකර්ෂණය කර ගනියි.



(සිතුවම් අංක 1: පද්මපානි බෝසත් සිතුවම)

ත්‍රිභංග ඉරියව්වෙන් *(Triplex posture*) නෙළුම් මලක් අතින් ගත් විලාසයකින් නිරූපණය කොට ඇති මෙම බෝසත් සිතුවම සර්වාභරණයෙන් සමලංකෘත වූවකි. පිරුණු අත්, පුළුල් උරතල, උස් නළල, කාරුණික ඇස් හා ඇහි බැම, දිගු තියුණු නාසය මෙන් ම මුඛය හා තොල් සඟල ද, නර්තන විලාසයක් පෙන්නුම් කරන අතැඟිලි ද ඉතා ස්වාභාවික අන්දමින් චිත්‍රණය කොට ඇත. එමෙන් ම ශීර්ෂයේ පැළඳි කිරීටය, කර්ණාභරණ, ගෙලෙහි

බැඳි මුතුපට, අතෙහි හා බාහුවෙහි ඇති වළලු, උරතලය හරහා දමා ඇති පළඳනාව ද මෙම බෝසත් සිතුවමට අලංකාරයක් එකතු කොට ඇත. මෙම සිතුවම ඉන්දියානු කලාවේ අග්‍ර ඵලයක් ලෙස විද්‍යාර්ථීන්ගේ අවධානයට ලක් වූවකි. *"Boddhisatwa padmapani ; are portrait is undoubtedly considered the pride of Indian Art" (Ibid 12).*

අජන්තා අංක 1 ගුහාවෙහි චිත්‍රණය කොට ඇති වජිරපානි (Vajirapani) බෝසත් සිතුවම ද ඉතා ප්‍රකට ප්‍රෙස්කො සිතුවමකි. සංකීර්ණ ශීර්ෂාභරණ, කුණ්ඩලාභරණ හා ගෙල මාලවලින් අලංකාර කොට ත්‍රිභංග ස්වරූපයෙන් දකුණතින් මලක් ගත් ආකාරයකින් නිරූපිත වජිරපානි බෝසත් සිතුවම මහායාන සම්ප්‍රදායට අනුගතව නිර්මාණය වූවක් බව සැලකේ.



(සිතුවම් අංක 2: වජිරපානී බෝසත් සිතුවම)

මේ අතර අංක 1 ගුහාවෙහි ඇති තවත් ප්‍රකට චිත්‍රයකි කාලවර්ණ කුමාරිකාවන් *(Dark Princess)* ලෙස හඳුන්වා ඇති සිතුවම. ශ්‍රී ලංකාවේ සීගිරි සිතුවම් සිහියට නඟන එහි ස්ත්‍රී ලාලිත්‍යය මැනවින් නිරූපණය වෙයි. පුන් පියොවුරු, ශීර්ෂාභරණ, කුණ්ඩලාභරණ මෙන් ම ගෙල බැඳි මාල, සිහින් දිගු නෙත්, තොල්, නිකට ආදිය ඉතා ස්වාභාවික ලෙස නිරූපණය කොට ඇති එම සිතුවමෙහි වර්ණ සුරක්ෂිතව ඇති බැවින් වැඩි දෙනකුගේ ආකර්ෂණය දිනා ගනී.



(සිතුවම් අංක : 3 කාලවර්ණ කුමාරිකාවන්ගේ සිතුවම)

මෙම සිතුවම්වලට අමතරව අංක 1 ගුහාවෙහි මහායාන සම්ප්‍රදායන්හි ප්‍රචලිත ජාතක කතා රැසක් චිත්‍රණය වී ඇත. ඒ අතුරින් සිබි ජාතකය *(Sibi Jataka)*, සංඛපාල ජාතකය *(Sankapala Jataka)*, චම්පේය ජාතකය *(Champeya Jataka)* වැනි කතාවල විශේෂ අවස්ථා එම සිතුවම්හි අන්තර්ගතය. *(Ibid 12-16).*

එමෙන් ම අංක 1 ගුහාවෙහි සිතුවම් අතර බුද්ධ චරිතයේ විශේෂ අවස්ථා රැසක් චිත්‍රණය කොට ඇති බව නිරීක්ෂණය කළ හැකිය. බෝසතුන්ගේ රාජකීය ස්නානය පිළිබඳ සිතුවම එහි විශේෂයෙන් කැපී පෙනෙන්නකි.



(සිතුවම් අංක 4: රාජකීය ස්නානය පිළිබඳ සිතුවම)

කාලයාගේ ඇවෑමෙන් ක්‍රමයෙන් දුර්වර්ණව ගිය ද බෝසතුන් දුටු සතර පෙර නිමිති, *(Four drives – An old man, Sick man, A corpse, A monk)* මාර පරාජය වැනි චිත්‍ර ද අජන්තා අංක 1 ගුහාවෙහි චිත්‍ර අතර නිරීක්ෂණය කළ හැකි ය.

බෝසත් චරිතයේ හා බුද්ධ චරිතයේ යම් යම් අවස්ථා අංක 2 ගුහාවෙහි නිරූපණය කොට තිබේ. එම ගුහාව ද මහායාන විහාරයකි. *(Mahayana Monasrery)* මෙහි ඇති සිතුවම් අතර ඉරන්දතී නාග රැජිණ ලෙසට හඳුනා ගෙන ඇති සිතුවම වැඩි දෙනකුගේ අවධානයට ලක්ව ඇත්තේ සංකීර්ණ වර්ණ, මුල් ස්වරූපයෙන් ආරක්ෂා වී ඇති බැවිනි. එමෙන්ම ස්ත්‍රී අඟපසඟ ඉතා ස්වාභාවිකව හා අනුරාගී ස්වරූපයෙන් ඉස්මතුව පෙනේ.



( සිතුවම් අංක 5: ඉරන්දතී)

බෝධිසත්ත්වයන්ගේ අවසන් උපත එනම් බුද්ධත්වය ලබන ආත්ම භාවයේ උපත සිදු වූ ආකාරය පිළිබඳ දෙවැනි ගුහාවේ සිතුවම්වලින් නිරූපිත ය. එහි මහාමායා දේවිය සුවිශේෂ කොට නිරූපණය කොට ඇත. ඇයට සිදුහත් කුමරු ඉපදීමට පෙර නිමිත්තක් ලෙස පෙනුණු සුබ සිහිනය මෙන් ම ඇය ඒ පිළිබඳ සුද්ධෝදන රජු සමඟ පැවසීම ද දෙවැනි ගුහාවේ සිතුවම් අතර දැක ගත හැකි ය. අතිශයින් ජීවමාන ගුණයෙන් හෙබි මෙම සිතුවම් නරඹන්නන් බුද්ධ කාලයට රැගෙන යන්නට සමත් ය. මායා දේවිය දුටු සිහිනය බ්‍රාහ්මණවරුන් අර්ථකථන කරන ආකාරය මෙන් ම මහාමායා දේවියගේ මුහුණෙන් ප්‍රසූත වේදනාව පෙන්නුම් කරන ලුම්බිණියේදී කුමරුගේ උපත සිදු වීමත් සංවේදී ලෙස චිත්‍රණය කොට ඇත. මීට අමතරව විශාල ප්‍රමාණයේ බුද්ධ රූපයක් ද එම ගුහාවෙහි දැක ගත හැකි ය.

අජන්තාවෙහි ඇති කුළුණු 28ක ආධාරයෙන් පිහිටි විශාල ගුහාව 4 වන ගුහාවයි. ඇතැම් තැනක කටයුතු නොනිමිව පැවතුණද බුදුන්ගේ පද්මාසනාරූඪ රූපයක් කලාකරුවා නේත්‍රෝත්සවාකාරයෙන් චිත්‍රණය කොට ඇත. නිමාවක් නොලද තවත් ගුහාවක් වුව 5 වන ගුහාවෙහි සිතුවම් නරඹන්නන්ගේ නෙත් මදකට රඳවා ගැනීමට සමත් ය. විනෝදකාමී තරුණ යුවලවල් එහි චිත්‍රණය කොට ඇත. නෙළුම් මල් මත හිඳගෙන සිටින බුදුවරුන් ගණනාවක් චිත්‍රණය කොට ඇති 7 වන අජන්තා ලෙන සෘජුකෝණාස්‍රාකාර සැලැස්මකට අනුව නිර්මාණ කරනු ලැබූවකි.

අජන්තාහි පැරණි ම ලෙන් අතුරින් තවත් එකක් ලෙස 9 වැනි ලෙන (දේශන ශාලාව) හැඳින්විය හැකි අතර එය දිගටි හැඩයකින් යුක්ත වෙයි. මධ්‍යයේ කුඩා ස්තූපයකි. මෙහි ඇති බුදුන්ගේ රූප පසුකාලීනව සිදු වූ මහායාන එකතු කිරීම් බව පෙනේ.

හීනයාන සම්ප්‍රදායයේ පැරණිත ම චෛත්‍යය 10 වැනි ගුහාවේ ඇත. එහි විවිධ කාල පරිච්ඡේදවලට අයත් සිතුවම් ඇත. වම් දිශාවට වන්නට සම්ප්‍රදායික ආයුධ සහිත සොල්දාදුවන් පිරිසක් සමඟ සිටින තේජවන්ත රජකුගේ දර්ශනයකි. එමෙන්ම එහි බෝධීන් වහන්සේට නමස්කාර කිරීමේ සිතුවමක් සහ ඡද්දන්ත ජාතකය සහ ශ්‍යාම් ජාතකය *(Shadanta Jataka & Shyam Jataka)* නිරූපණය කොට ඇත.

අජන්තාවෙහි ඇති ඇතැම් ගල් ලෙන් භික්ෂූන් වහන්සේලාට වැඩ සිටීම සඳහා සකස් කරන ලද බවට සාක්ෂි පවතී. ගල් ඇඳන් සහ ගුහා අභ්‍යන්තරයෙහි තවත් කාමර වෙන් කර තිබීම ඊට හේතුවයි. බොහෝ ගුහාවන්හි ඉඩ කඩ වර්ග අඩි 1000ක් 2000ක් පමණ තරම් ය. ඇතැම් ඒවායෙහි වැඩ අතරමග නවතා දැමූ සෙයක් ද නිරීක්ෂණය කළ හැකි ය. අර්ධ වශයෙන් තැනූ ප්‍රතිමා හා නිම නො කළ කැටයම්, කුළුණු ඒවායෙහි දැක ගත හැකි ය.

ගුහා අංක 16 වැදගත් වන්නේ එහි ඇති සෙල්ලිපියක් නිසාය. එම ගුහාව සකස් කරනු ලැබ ඇත්තේ වාකාටක රජ පරපුරේ හරිසෙන් රජු විසිනි. (ක්‍රි.ව 475 - ක්‍රි.ව 500) ඒ බව එම ගුහාවේ කොටා ඇති සෙල්ලිපියක සඳහන් ය (Alora p. 54,55p). මෙහි බිත්ති, කුළුණු, බාල්ක ආදියෙහි සිතුවම් මෙන් ම විවිධ ස්වරූපයේ මූර්ති ද දැකගත හැකිය. ඒ අතර බුදුන්ගේ දේශනා ඉරියව්වෙන් සිටින දැවැන්ත මූර්තිය, පියාසර චලන සහිත අප්සරාවන්, වාමන රූප, සංගීතඥයන්ගේ මූර්ති වැදගත් වේ.

මෙහි ඇති සිතුවම් අතර මිය යන කුමරිය (*The dying princess*) නමින් ප්‍රකට ක්ලාන්ත වීමේ ඉරියව්වක් නිරූපණ කරන කාන්තා සිතුවම විශේෂ වූවකි. ඇය වත්තන් කර ගැනීමට තවත් කාන්තාවක් ඉදිරිපත් වන ආකාරයත්, ඒ දෙස වික්ෂිප්තව බලා සිටින තවත් කාන්තාවන් පිරිසකුත් එහි චිත්‍රණය කොට ඇත.

එසේ ම සුජාතා සිටු දියණිය බුදුන්ට කිරි පිඬු පූජා කිරීම පිළිබඳ සිතුවම ද, සිදුහත් කුමරු කුඩා කල වප් මඟුල් උත්සවයේදී භාවනා කළ ආකාරය විදහාපාන සිතුවම ද, 19 වැනි ගුහාවේ ඇති චිත්‍ර අතුරින් වැඩි දෙනාගේ අවධානයට පාත්‍ර වී ඇත.

අජන්තාවෙහි තවත් විශිෂ්ට ගණයේ බෞද්ධ ආරාමයක් අංක 17 වැනි ගුහායෙහි දැක ගත හැකි ය. එම සුවිශේෂතාවට හේතුව අතිවිශිෂ්ට ගණයේ බිත‍ු සිතුවම් ඇතිවා සේම ඒවා නිසි ලෙස සංරක්ෂණය වී තිබීමයි. ආරාමයේ දොරටුවට ඉහළින් බුද්ධ රූප කිහිපයක් නිරූපණය කොට තිබේ. ඒවායේ නම් ද සඳහන් ය. සිඛී, විස්සභූ, කකුසඳ, කෝණාගම, කාශ්‍යප, ශාක්‍යමුණි (ගෞතම), මෛත්‍රි *(Sikhin, Visvabhu, Krakuch – Chhanda, Kanakamuni, Kasyapa, Sakyamuni, Maiterya)* මෙම බුද්ධ රූපවලට පහළින් විවිධ ඉරියව්වලින් සිටින පුද්ගල ජෝඩු 8ක් ධර්මශ්‍රවණාභිලාෂීන් ලෙස චිත්‍රණය කොට ඇත.

එමෙන්ම පියාඹන අප්සරාවකගේ ප්‍රසිද්ධ රූපයක් ආරාමයේ දොරටුවට යාබදව දකුණු දිශාවට වන්නට නිරූපණය කර ඇත. මෙහි ජාතක කතා කිහිපයක් චිත්‍රණය කිරීමට කලාකරුවා පෙලඹී ඇති බව දැක ගත හැකි

ය. වෙස්සන්තර ජාතකය, මහා කපි ජාතකය සහ සුතසෝම ජාතකය, මාතුපෝසක ජාතකය ආදි ජාතක කතා ඒ අතර වෙයි. මෙම ගුහාවේ දක්නට ඇති තවත් සංවේදී බිතු සිතුවමක් ලෙස බුදුන් වහන්සේ බුද්ධත්වය ලබා ප්‍රථම වරට මැදින් පොහෝ දින තම උපන් ගම බලා පිටත් ව ගොස් ගිහි කල ප්‍රියම්බිකාව (යශෝදරා දේවිය) සහ පුත් රාහුල කුමරු හමුවීම සිත්තරා අපූරුවට සිතුවම් කර ඇත.



(සිතුවම් අංක 6: බුදුන් වහන්සේ යශෝදරා හමුවීම)

ලංකාවට විජය කුමරු ඇතුළු 500ක් දෙනා පැමිණීම නිරූපණ කෙරෙන සිතුවමක් 17 වන ගුහාවේ දැකිය හැකි ය. එහි ඇති  සේවිකාවන් දෙදෙනකු සමග කැඩපතක් අතින් ගත් කුමරියකගේ චිත්‍රය ලෝක ප්‍රසිද්ධ සිතුවමක් ලෙස ජනාදරයට ලක් වූවකි.

පන්සිය පනස් ජාතක කතා අතර වඩාත් ප්‍රසිද්ධ සස ජාතකය මෙහි නිරූපිතය. බෝධිසත්ත්වයන්ගේ අපරිමිත ත්‍යාගශීලි බව ඉස්මතු වන ආකාරයෙන් එම වෘත්තාන්තය සිතුවම් කිරීමට සිත්තරා සමත් වී ඇත. මෙම ආරාමයේ සිවිලිම සුන්දර මල් මෝස්තරවලින් හා මනස්කාන්ත සත්ත්ව මෝස්තරවලින් විසිතුරු කොට ඇත.

19 වැනි ගුහාව ද කැපී පෙනෙන සිතුවම් හා කැටයම්වලින් පෝෂිත ය. පියාඹන අර්ධ මිනිස් ජෝඩු, අලි ඇතුන් සහ දිව්‍ය සතුන් මෙහි අපූර්ව ලෙස ඉන්දීය කලාකරුවා චිත්‍රණය කර ඇති අයුරු දැක ගත හැකි ය. දෙවන විශාලත ම ගුහාව ලෙස ඉතිහාසයට එක් වන 24 වැනි ගුහාව තවත් නේත්‍රාකර්ෂණීය ගුහාවකි. මෙය ද විසිතුරු කැටයම් සහ සිතුවම්වලින් අනූන බව පැවසිය යුතු ය. අවසාන වශයෙන් 26 වැනි ගුහාවෙහි බුද්ධ පරිනිර්වාණය චිත්‍රණය කොට ඇති ආකාරය දැක ගත හැකි ය. එහි ආකාශයේ සිටින්නවුන් (ස්වර්ගයේ සිටින්නවුන්) බුදුන්ගේ පරිනිර්වාණය පිළිබඳ ප්‍රීති වන ආකාරයත්, මිහිකතේ සිටින්නවුන් දුක් අඳෝනා නගන අයුරුත් නරඹන්නාට දොම්නස් හැඟීම් ජනනය කරවමින් චිත්‍රණය කොට ඇත.

අජන්තා ගුහාවල ඇඳ ඇති චිත්‍ර හා සීගිරි සිතුවම් පිළිබඳ තුලනාත්මක නිරීක්ෂණයකදී ඉස්මතු වන කරුණු රැසක් පවතී. මෙම චිත්‍ර සම්ප්‍රදායයන් දෙක පිළිබඳව විද්වතුන් ඉදිරිපත් කළ අදහස් කිහිපයක් විමසීමෙන් එම කරුණු ඉස්මතු කර ගත හැකි ය.

අජන්තා සිතුවම් ආභාසයෙන් සීගිරි සිතුවම් ඇඳ ඇති බවට අදහස් පළ කරන ශ්‍රී ලාංකේය විද්වතුන්ගේ මතවාදවල විවිධත්වයක් පවතී. 'අපේ සංස්කෘතිය' නම් කෘතිය රචනා කළ බද්දේගම විමලවංශ හිමියන් ස්වකීය කෘතියේ එක් තැනක මෙම චිත්‍ර සම්ප්‍රදායයන් දෙක පිළිබඳ ප්‍රශ්නාර්ථයක් මතු කරයි.

> "*මේ චිත්‍ර කාගේ කෘතියක් ද? ලංකාවේ කලාකාරයන්ගේද නැතහොත් අජන්තාවෙන් කොපි කරගත් සම්ප්‍රදායයක් ද?* " (විමලවංශ හිමි, 1964:534).

එම කෘතියේ තවත් තැනක උන්වහන්සේ සඳහන් කරන්නේ සීගිරි චිත්‍ර හා අජන්තා චිත්‍ර සම නො වන බවත්, අජන්තා චිත්‍ර වඩාත් සමාන වන්නේ හිඳගල චිත්‍රවලට බවත් ය.

*"අජන්තා චිත්‍රවල ඇති වර්ණ සංකලනය මෙහි දැකිය නො හැකි ය. රූප ලක්ෂණ සම්ප්‍රදායය තරමක් සමාන වුව ද, රූපවල වස්ත්‍ර විලාස ආදියේ කිසි සමානකමක් නැත්තේ ය. හැඩරුවද වෙනස් ය. අජන්තා චිත්‍ර සමාන වන්නේ හිඳගල චිත්‍රවලට ය. වර්ණයන්ගෙන් ද, රේඛාවන්ගෙන් ද එය බොහෝ දුරට සමානය. කාලය අතින් ද මෙහි සමකමක් දක්නට ලැබේ. හිඳගල චිත්‍ර 7 වන සියවසේ යැයි අනුමානයෙන් තීරණය කරති. අජන්තාවේ බොහෝ චිත්‍ර ද 7 වැනි සියවසට අයත් යැයි සලකති. ඉඩ ඇති සෑම තැනම රූපයක් ඇඳීම අජන්තාවේ සම්ප්‍රදායය බව පැවසේ. ඒ ලක්ෂණ ඇති එකම තැන හිඳගලයි* (විමලවංශ හිමි, 1964:534).

කෙසේ වුවද 7 වන සියවසේ චිත්‍ර ඇඳීමේ දක්ෂතාව සහිත ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම ලංකාවේ සිටි බවට සිතීමට තුඩු දෙන කතා පුවතක් ශ්‍රී හර්ෂ දේවයන්ගේ රත්නාවලී නාට්‍යයේ ඇත. ඒ වූ කලී ලක්දිවෙන් ගිය කුමරියක වූ රත්නාවලී උදේනි රජුගේ සිතුවමක් ලෑලි කැබැල්ලක ඇඳීම පිළිබඳ වෘත්තාන්තයයි. මීට අමතරව මිහින්තලේ හා පොළොන්නරුව තිවංක පිළිම ගෙයි ශේෂව ඇති සිතුවම්වල ලක්ෂණ සලකා බැලූ ඇතැම් විද්වතුන් පෙන්වා දී ඇත්තේ ඒවායේ සීගිරි හා අජන්තා සිතුවම්වලට සමානකම් දක්වන බවයි. මිහින්තලා සිතුවම් 8 වන සියවසට අයත් යැයි සැලකෙන අතර පොළොන්නරු තිවංක පිළිම ගෙයි සිතුවම් 13 වන සියවසට අයත් විය හැකි බවට මහාචාර්ය පරණවිතාන විශ්වාස කරයි.

සීගිරි සිතුවම් බොහෝ ප්‍රමාණයක් සිතුවම් වී ඇත්තේ ඉගෙන් ඉහළ කොටස පමණක් වන නිසාත්, ඔවුන් ඉගෙන් පහළ කොටස වළාකුලෙන් වැසුනා සේ නිරූපණය වී ඇති නිසාත් ඔවුන් අප්සරාවන් විය හැකි බව ආනන්ද කුමාරස්වාමි පෙන්වා දෙයි. එහෙත් ලස්සන අප්සරාවන් සහ අවලස්සන අප්සරාවන් යනුවෙන් දෙකොටසක් නො සිටිය හැකි බැවින් එම මතය නිෂේධනය වන බව විමලවංශ හිමියන් පවසයි. මේ චිත්‍රවලින් නිරූපණය වන්නේ මල් නෙලන බිසෝවරුන් හා සේවිකාවන් බව විමලවංශ හිමියන්ගේ මතයයි. පරණවිතානට අනුව මෙම චිත්‍රවලින් නිරූපණය වන්නේ විදුලිය හා මේඝයයි. H.C.P. බෙල් පවසන්නේ අසල විහාරයට මල් ගෙන යන බිසෝවරුන් හා සේවිකාවන් බවයි.

කෙසේ වුවද අපගේ නිරීක්ෂණය මගින් පැහැදිලි වූයේ ද අජන්තා සිතුවම් හා සීගිරි සිතුවම් අතරෙහි සමානකම් මෙන්ම අසමානකම් ද පවතින බවයි. සීගිරි සිත්තරුන් රතු, කහ, හා දුඹුරු යන වර්ණ කිහිපයක් භාවිත කොට ඇත. අජන්තාවේ චිත්‍ර ශිල්පීන්ගේ වර්ණ භාවිතය ඊට වඩා සංකීර්ණ බවක් පෙන්නුම් කරයි. කහ, කොළ, නිල්, දුඹුරු, කළු, දම්, රතු වැනි වර්ණ සමූහයක් ඔවුන් භාවිත කොට ඇත. සීගිරි චිත්‍ර හා අජන්තා සිතුවම් සමාන බවට මත පළ කරන්නන්ගේ ප්‍රධාන තර්කයක් වන්නේ උඩුකය නිරුවත්ව කාන්තාවන්ගේ පුන් පියොවුරු ඉස්මතු වන ආකාරයෙන් නිරූපණය කොට තිබීමයි.

කඩුපුල් මලක් අතින් ගත් බෝධිසත්ත්ව රූපයක් හා කාන්තා රූප දෙකක් සීගිරි චිත්‍රවලට සමාන බව බැලූ බැල්මට පෙනේ. එහෙත් එහි ප්‍රධාන චිත්‍රයකින් නිරූපණය වන්නේ බෝධිසත්ත්වයෙකි. එහි ශීර්ෂයේ ඇති කිරීටය හෝ ආභරණ සීගිරි අප්සරාවන්ගේ ආභරණවලට කිසිසේත් සමාන නොවේ. අජන්තා ශීර්ෂ ආභරණ පළඳනාවල ඇත්තේ සීගිරියට කිසිසේත් සමාන නොවන විලාසිතාවකි. උඩුකය නිරුවත්ව නිරූපණය වී ඇති චිත්‍ර අජන්තාවේ දැකිය හැක්කේ ඉතා කලාතුරකිනි. එමෙන්ම උඩු කය පමණක් නිරූපණය කොට ඇති චිත්‍ර ද දැකිය හැකි ය. ස්වාභාවික අවකාශය මත භාවපූර්ණ රූප ඇඳීමට ඇති බාධක නිසා එසේ වූ බව සිතිය හැකිය. එහෙත් සීගිරියේ සියලුම රූප නිරූපණය වී ඇත්තේ උඩු කය පමණි. අනෙක් අතට සීගිරියේ ඇත්තේ ලෞකික චිත්‍ර සමූහයකි. අජන්තා සිතුවම් සියල්ලක්ම පාහේ ආගමික අන්තර්ගත සහිත ඒවා ය.

## 3. සමාලෝචනය

බෞද්ධ සිතුවම් කලාවේ අග්‍රත ම ඵලයක් ලෙස අජන්තා සිතුවම්වලට හිමි වන්නේ අසමසම ස්ථානයකි. වසර 1500ට වඩා වැඩි ඉතිහාසයක් සහිත එම සිතුවම් මගින් ඉන්දීය කලාකරුවාගේ අභිමානය ලෝකයට විදහාපානු ලබයි. එමෙන්ම මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ බෞද්ධ ප්‍රබෝධයේ සංකේතයක් ලෙස ද ඕරන්ගාබාද්හි අජන්තා ලෙන් විහාර සංකීර්ණයත්, එහි සිතුවම් හා මූර්තිත් හඳුනා ගත හැකි ය. අජන්තා සිතුවම් සම්ප්‍රදායය ලංකාවේ සීගිරි චිත්‍ර කෙරෙහි යම් බලපෑමක් ඇති කරන්නට ඇතැයි යන්න විද්වතුන් කිහිප දෙනකුගේ අදහසක් පමණි. මෙම සම්ප්‍රදායයන් දෙකේ චිත්‍ර පිළිබඳ බැලූ බැල්මට පෙනෙන සමානකම් සේම අසමානකම් රැසක්ද පවතින බව කිව යුතුය. අපගේ පෞද්ගලික අදහස නම් අජන්තාවට ආවේණික සම්ප්‍රදායය, එකක් වන අතර සීගිරි සම්ප්‍රදායය අනෙකක් බවයි. ඒ දෙක අතරෙහි සමානකම් සොයනවාට වඩා අසමානකම් සෙවීම පහසු ය.

## පරිශීලිත මූලාශ්‍රය


මනතුංග, ඒ., (2004). ***සීගිරි චිත්‍ර,*** ජාඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ.

විමලවංස හිමි, බී., (1964). ***අපේ සංස්කෘතිය***, කොළඹ: ඇම්.ඩී ගුණසේන සමාගම.

වුටිවොංග්ස්, එන් සහ තවත් අය, (1990). ***ශ්‍රී ලංකා බිතුසිතුවම්***, කොළඹ: ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල.

හෙට්ටිආරච්චි, ඩී. ඊ., (සංස්.) (1963). ***සිංහල විශ්ව කෝෂය,*** ශ්‍රී ලංකාව: සංස්කෘතික දෙපාර්තමේන්තුව.

Almohammadi, A.M and pand, R., (2011). ***Ajanta and Ellora, A unesco word Heritage site***, New Delhi: Mittale Publications.